# DAC
# ඇගයීමේ නිර්ණායක
## බලපෑම

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දදායකයින්ට වඩාත් සමීප හා කාර්යක්ෂම නියෝජිතයන් වීමට ඔබ කැමැත්තක් දක්වන්නේද?

ඔබේ ඡන්දදායකයන් නියෝජනය කරමින් පාර්ලිමේන්තු විවාදවලදී නිසි ප්‍රශ්න මතු කරමින් රටේ සංවර්ධනය උපරිම කිරීමට හා එහි ප්‍රතිඵල ඔවුන්ට ලබාදීමට ඔබ උනන්දුවක් දක්වන්නේද?

එසේ නම් ඇගයීම පිළිබඳ **OECD DAC** නිර්ණායක ඔබට ප්‍රයෝජනවත් වියහැක. ඒ සඳහා මෙම කෙටි පත්‍රිකා මාලාව කියවන්න.

**ඇගයීම් පිළිබඳ ආසියා පැසිෆික් කලාපයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංසදය**

## හැඳින්වීම

ප්‍රජාතන්ත්‍රවාදයේ මූලිකහරය වන්නේ පාර්ලිමේන්තුව තුලින් වගවීම, විනිවිදභාවය හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. නීති සම්පාදනයේ ප්‍රමුඛයින් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් රටේ සංවර්ධනයේ ප්‍රධාන කොටස්කරුවන්ය. පාර්ලිමේන්තු විවාදවලදී සංවර්ධන වැඩසටහන් පිළිබඳව හරවත් ප්‍රශ්න ඇසීම මගින් ඇගයීම් වලින් ලබාගන්නා තොරතුරු භාවිතා කිරීමෙන්, තිරසාර සංවර්ධනය සඳහා ජාතික ක්‍රියාවලියෙන් සම්පත් වෙන්කිරීමේදී පාර්ළිමේන්තු මන්ත්‍රීවරුන්ට මෙම ක්‍රියාවලියට දායකවිය හැකිය.

සංවර්ධනය සඳහා වන මැදිහත්වීම් පිළිබඳ මනා අවබෝධය සමග ඒකාබද්ධ වූ OECD/DAC ඇගයීම් නිර්ණායක පුරවැසියන් සඳහා උපරිම ප්‍රතිලාභ සහතික කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පාර්ලිමේන්තු විවාද සහ ආයෝජන කමිටු රැස්වීම්වලදී හරවත් ප්‍රශ්න ඇසීමට සහාය විය හැකිය.

මෙම පත්‍රිකා මාලාව තුලින් OECD/DAC නිර්ණායක හය පිළිබඳව විස්තර කරනු ලබයි.

## බලපෑම

OECD/DAC මගින් බලපෑම අර්ථ දක්වන්නේ සංවර්ධන වැඩසටහන් ජනතාවගේ ජීවන තත්ත්වය කොතරම් දුරට වෙනස් කරන්නේද යන්නයි.

එනම්, සංවර්ධන වැඩසටහන් මගින් සැලකිය යුතු ධනාත්මක හෝ සෘණාත්මක, අපේක්ෂිත හෝ අනපේක්ෂිත ඉහළ මට්ටමේ ප්‍රතිඵල උත්පාදනය කර ඇති හෝ උත්පාදනය කිරීමට අපේක්ෂා කරන ප්‍රමාණයයි.

## මූලික අර්ථ දැක්වීම්

සංවර්ධන වැඩසටහන් වල අවසාන වැදගත්කම සහ පරිවර්තනීය ප්‍රතිඵල ජන ජීවිතය තුල සිදුකරන වෙනස ලෙස හඳුන්වයි. සඵලතා නිර්ණායකය යටතේ දැනටමත් ආවරණය කොට ඇති, ඒවාට වඩා දීර්ඝකාලීන හෝ විෂයපථය වශයෙන් පුළුල් පරාසයක වන සංවර්ධන වැඩසටහන්වල සමාජ, පාරිසරික සහ ආර්ථික බලපෑම් හඳුනා ගැනීමට එය දායක වේ. මෙම නිර්ණායකය සංවර්ධන වැඩසටහන්වල ක්ෂණික ප්‍රතිඵල වලින් ඔබ්බට ගොස් වක්‍ර, ද්විතීයික සහ විභව ඵල අත්පත් කර ගැනීමට දායක වේ. මිනිසුන්ගේ යහපැවැත්ම, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ පරිසරය කෙරෙහි ඇති විය හැකි විභව බලපෑම්, පද්ධතිවල හෝ සම්මතයන්ගේ පරිපූර්ණ සහ කල්පවත්නා වෙනස්කම් පරීක්ෂා කිරීමෙන් සිදු කරනු ලබයි.

**ඇගයීමේ නිර්ණායක**

**උචිතබව**
සංවර්ධන වැඩසටහන නිවැරදි දේ සිදු කරන්නේද?

**ඒකාබද්ධභාවය**
සංවර්ධන වැඩසටහන කොතරම් දුරට යෝග්‍ය වන්නේද?

**සඵලතාව**
සංවර්ධන වැඩසටහන එහි අරමුණු ළඟා කරගන්නේද?

**කාර්යක්ෂමතාව**
සම්පත් කොතරම් දුරට භාවිත වන්නේද?

**බලපෑම**
සංවර්ධන වැඩසටහන කිනම් වෙනසක් ඇති කරන්නේද?

**තිරසාරභාවය**
ප්‍රතිලාභ දීර්ඝ කාලීනව පවතින්නේද?

## පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට බලපෑම පිළිබඳ නිර්ණායක භාවිත කළ හැකි ආකාරය

සෑම රටකම පාහේ, ජනතාවගේ ජීවිත වැඩිදියුණු කිරීමට සැලසුම් කර ඇති ප්‍රතිපත්ති හෝ වැඩසටහන් සඳහා රජයන් සැලකිය යුතු ප්‍රමාණයක් රාජ්‍ය අරමුදල් ආයෝජනය කරයි. දරිද්‍රතාවය පිටුදැකීම, සෞඛ්‍ය හා අධ්‍යාපනය වැඩිදියුණු කිරීම, පරිසරය සුරැකීම සහ තවත් බොහෝ දේ සඳහා වන ප්‍රතිපත්ති සහ වැඩසටහන් මෙහි අන්තර්ගත වේ. බලපෑම මැනීම අපට එවැනි සංවර්ධන වැඩසටහනකට ආරෝපණයකළ හැකි දීර්ඝකාලීන වෙනස තීරණය කිරීමට ඉඩසලසයි.

මෙම සංවර්ධන වැඩසටහන් සඳහා වන ප්‍රතිපාදන ඇතුළත් ජාතික අයවැය පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබේ. රජයේ විධායක ශාඛාව පිළිබඳ අධීක්ෂණය කිරීමේ කොටසක් ලෙස, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එවැනි වැඩසටහන්වල දීර්ඝකාලීන ප්‍රතිලාභ තක්සේරු කිරීම පමණක් නොව, අතීතයේ ඊට සමාන ප්‍රතිපත්ති හෝ වැඩසටහන්වල බලපෑම අවබෝධ කරගැනීම සිදු කළ හැකිය.

බලපෑමට උදාහරණ ලෙස, දරිද්‍රතාවය පිටුදැකීමේ වැඩසටහනක ප්‍රතිඵලයක් ලෙස දරිද්‍රතාවයෙන් මුදාගෙන වසර 5ක් හෝ ඊට වැඩි කාලයක් එහි රැඳී සිටින පවුල් සංඛ්‍යාවේ වැඩිවීම, සෞඛ්‍ය සංවර්ධන වැඩසටහනක ප්‍රතිඵලයක් ලෙස සෑම ළමුන් 1,000කටම වයස අවුරුදු 5ට පෙර මිය යන (ළමා මරණ අනුපාතිකය) ළමයින් සංඛ්‍යාවේ අඩුවීම, අධ්‍යාපන වැඩසටහනකින් පසු වැඩි දියුණු කළ විභාග කාර්ය සාධනය හේතුවෙන් ශිෂ්‍යයන්ගේ වාසිදායක රැකියා ලැබීමේ ප්‍රතිශතය ඉහළ යාම යනාදිය දැක්විය හැක.

බලපෑම් පිළිබඳ වන නිර්ණායක පිළිබඳ අවබෝධය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට රජයේ වියදම්වලින් පුරවැසියන් සඳහා ලැබෙන දීර්ඝකාලීන ප්‍රතිලාභ පිළිබඳව වන විවාද සභාගර්භයේදී සහ පාර්ලිමේන්තු කාරකසභාවලදී උචිත ප්‍රශ්න ඇසීමට ඉඩ සලසයි. බලපෑම කෙරෙහි වැඩි අවධානයක් යොමුකිරීම මගින් රජයේ වැඩසටහන් සහ ප්‍රතිපත්ති ඔවුන්ගේ ඉලක්ක කෙටි කාලීනව ඉටුකිරීම පමණක් නොව, මිනිසුන්ගේ ජීවිතවලට සැබෑ සහ කල්පවත්නා වෙනසක් ඇතිකරන බව සහතික කිරීමටද උපකාරී වේ.

## බලපෑම සහතික කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඇසිය හැකි ප්‍රශ්න

සංවර්ධන වැඩසටහනක, ව්‍යාපෘතියක හෝ ප්‍රතිපත්තියක බලපෑම පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් ඇසිය හැකි ප්‍රශ්න සඳහා නිදසුන් පහත දැක්වේ. කෙසේ වෙතත්, ප්‍රශ්න ඇසීමේදී නිර්මාණශීලීවීම, රටේ සන්දර්භය සැලකිල්ලට ගැනීම, සංවර්ධන වැඩසටහනක හෝ ප්‍රතිපත්තියේ ස්වභාවය සහ විවාදයේ සහ ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියේ අවශ්‍යතා සැලකිල්ලට ගැනීම වැදගත් වේ.

අ: සංවර්ධන වැඩසටහන් මගින් වෙනස්වනසුලු ස්වභාවයක සැලසුම්ගත ඉහළ මට්ටමේ ප්‍රතිඵල කෙතරම් දුරට සාක්ෂාත් කරගෙන තිබේද?

ආ: ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව, මානව හිමිකම්, පාරිසරික ගුණාත්මකභාවය සහ මිනිසුන්ගේ යහපැවැත්ම කෙරෙහි බලපාන ද්විතීයික සහ වක්‍ර ධනාත්මක ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන් මගින් කෙතරම් දුරට ඇතිකර තිබේද?

ඇ: සංවර්ධන වැඩසටහන් සහ ආයතනවල මැදිහත්වීම මගින් ඇතිකරගන්නා වූ දීර්ඝකාලීන වශයෙන් බලපාන වෙනස්කම් තිබේද? එසේ නම්, ඒවා මොනවාද?

ඈ: සංවර්ධන වැඩසටහන්වල ප්‍රතිඵලයක් ලෙස කාලයත් සමඟ මතු වූ අනපේක්ෂිත වෙනස්කම් (ධනාත්මක හෝ ඍණාත්මක) තිබේද?

ඉ: සැලකිය යුතු තත්ත්වයේ බලපෑම් සාක්ෂාත් කර ගැනීමට පහසුකම් දායක වූ සාධක සහ නිශේධනය කළ සාධක මොනවාද?

ඊ: සංවර්ධන වැඩසටහන් සඳහා ඇති බලපෑම අවබෝධ කරගැනීමෙන් ඉගෙනගත හැකි පාඩම් මොනවාද?

---

*Source: De Silva,S.(2021).Theory of Change For Development Success: Workbook. Colombo, Sri Lanka: Sri Lanka Evaluation Association*

## බලපෑම පිළිබඳ තවදුරටත් අධ්‍යයනය කිරීමට අවශ්‍ය මූලාශ්‍ර


OECD evaluation criteria, retrieved from
*https://tinyurl.com/2p9835a6*

OECD (2022) Understanding the six criteria: Definitions, elements for analysis and key challenges. retrieved from
*https://tinyurl.com/bddeffx8*



**ප්‍රකාශනය**

ASIA PACIFIC PARLIAMENTARIANS FORUM FOR EVALUATION

APEA Asia-Pacific Evaluation Association

Global Parliamentarians Forum for Evaluation



විමසීම්: apea.coordinator@gmail.com



**සිංහල පරිවර්තනය**

SLEvA
Sri Lanka Evaluation Association



විමසීම්: sleva.sec@gmail.com